# ලෝක ආහාර අර්බුදය සහ දේශීය කෘෂිකර්මය

දිනෙන් දින වෙනස්වන ලෝක ප්‍රවණතා අතර මිනිසා මුහුණ දෙන අර්බුදයන් ද විවිධ ස්වරූපයන් ගනී. එකී අර්බුදයන්ට මුහුණදීම සඳහා මිනිසා විසින් අනුගමනය කරනු ලබන ක්‍රමෝපායයන් ද සිත් ගන්නා සුළු ය. මේ වන විටත් ලෝකයේ දවෙන අර්බුදයන් අතර පෙරමුණ ගත් නවතම අර්බුදය වන්නේ ආහාර පිළිබඳ අර්බුදයයි. ඊට විසඳුම් සොයන මිනිසා සෙසු සියලු අර්බුදයන්ට වඩා වැඩි බරක් තබමින් මේ සඳහා විසඳුම් සොයමින් සිටී. ඒ, මෙම අර්බුදය ලොව වෙසෙන සුවහසක් ජීවීන්ට පොදු වන නිසාවෙනි.

විවිධ වූ සංවිධානයන් මඟින් සිදු කරනු ලබන පර්යේෂණ මෙන්ම ගවේෂණ තුළින් ජනනය කෙරෙන නව දැනුම, මිනිසා ස්වකීය අර්බුදවලින් මිදීමට භාවිතා කරයි. මේ වන විට, ආහාර අර්බුදය සමඟ ද්වන්ධ සටනකට පිවිස සිටින මිනිසාගේ සංවිධාන ශක්තිය, එක්සත් ජාතීන් හරහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මඟින් ඒකරාශී කොට ඇත්තේ මෙම බියකරු අර්බුදයෙන් මිදීමට ය. මෙම අර්බුදයට රටක්, ජාතියක් වශයෙන් කෙසේ මුහුණ දිය යුතු ද?

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 2008 වසරේ මැයි මස ආහාර ද්‍රව්‍ය විවරණිකාවට (Food Out Look, FAO May, 2008) අනුව සහල්, ධාන්‍ය, කිරි නිෂ්පාදන මිල දර්ශකයන් සහ සමස්ත ආහාර මිල දර්ශකයේ වෙනස්වීම වගු අංක 01න් පෙන්නුම් කරයි. මේ අනුව, 2007 වසරේ සමස්ත ආහාර මිල දර්ශකය, 2006 වසරට සාපේක්ෂව 23%න් ද, 2008 මාර්තු මස දර්ශක අගය 2007 වසරේ මාර්තු මස අගයට වඩා 57%කින් ද

**වගු අංක 01**

**ආහාර මිල දර්ශකය (ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය)**
(FAO Food Price Index) 1998-2000=100

| වර්ෂය/මාසය | | සමස්ත මිල දර්ශකය | ධාන්‍ය මිල දර්ශකය | සහල් මිල දර්ශකය | කිරි නිෂ්පාදනය මිල දර්ශකය |
|---|---|---|---|---|---|
| 2006 | | 127 | 124 | 117 | 138 |
| 2007 | | 157 | 172 | 137 | 247 |
| 2007 | මාර්තු | 146 | 151 | 120 | 186 |
| | අප්‍රේල් | 142 | 148 | 130 | 213 |
| | මැයි | 144 | 150 | 131 | 222 |
| | ජූනි | 151 | 159 | 133 | 252 |
| | ජූලි | 156 | 160 | 136 | 277 |
| | අගෝස්තු | 162 | 171 | 136 | 281 |
| | සැප්තැම්බර් | 171 | 195 | 138 | 290 |
| | ඔක්තෝබර් | 175 | 201 | 142 | 297 |
| | නොවැම්බර් | 181 | 203 | 149 | 302 |
| | දෙසැම්බර් | 187 | 224 | 157 | 295 |
| 2008 | ජනවාරි | 197 | 239 | 164 | 281 |
| | පෙබරවාරි | 217 | 282 | 184 | 278 |
| | මාර්තු | 220 | 284 | 218 | 276 |
| | අප්‍රේල් | 217 | 280 | 276 | 266 |
| | මැයි | 217 | 273 | 326 | 265 |

මූලය : ආහාර මිල දර්ශකය, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය
සටහන : සමස්ත මිල දර්ශකය සඳහා ප්‍රධාන ආහාර කාණ්ඩ 6 ක සාමාන්‍ය මිල ගණන් ඇතුළත් ය.
ධාන්‍ය මිල දර්ශකය තුළ සහල්, තිරිඟු සහ බඩඉරිඟු සාමාන්‍ය මිල ගණන් ඇතුළත් ය.

වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය වඩාත් තීව්‍ර කිරීමට හේතු වී ඇත්තේ කිරි නිෂ්පාදන, සහල්, ධාන්‍ය සහ තෙල් මෙන්ම මේද වර්ග වල මිල සීඝ්‍ර ලෙස ඉහළ යෑමයි. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වාර්තා වලට අනුව 2008 වසරේ මුල් මාස තුන තුළ පැවති ආහාර ද්‍රව්‍ය මිල ගණන්, ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගයන් වේ. තිරිඟු, සහල්, බඩ ඉරිඟු, සත්ත්ව නිෂ්පාදන සහ වෙනත් ධාන්‍ය වර්ගවල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර මේ තත්ත්වය විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ආහාර සුරක්ෂිතභාවය කෙරෙහි දැඩි ලෙස බලපා තිබේ. විශ්ලේෂකයන් පෙන්වා දෙන්නේ ආහාර ද්‍රව්‍ය වල මිල ඉහළ යෑම ඉදිරි වසර දහය තුළ දී තවදුරටත් වර්ධනය වන බවයි.

මේ ආකාරයට ආහාර ද්‍රව්‍ය වල මිල සීඝ්‍ර ලෙස ඉහළ යෑම තුළ ගෝලීය වශයෙන් ආහාර නිෂ්පාදනය සහ සැපයුමෙහි අර්බුදකාරී තත්ත්වයක් හට ගෙන ඇති බව පෙන්නුම් කෙරේ. මේ සඳහා ඊට බලපාන ලද ප්‍රධාන කරුණු මෙසේ දක්විය හැකිය.

- **ගෝලීය කාලගුණික විපර්යාස** (Global climatic change)

ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම, සාගර උෂ්ණත්වය ඉහළ යාම නිසා නියඟ තත්ත්වයන්, ගංවතුර හානි, භූ චලන සහ අහිතකර දේශගුණික තත්ත්වයන් නිර්මාණය වීම තුළින් කෘෂිකාර්මික නිෂ්පාදන පහත වැටීම, උදහරණ වශයෙන් වියට්නාමය හා බුරුමය වැනි රටවල් පෙන්වා දිය හැකිය. ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වලට අනුව වසර 2020 වන විට ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා ලෝක ආහාර නිෂ්පාදනය 16%කින් පහත වැටීම අපේක්ෂා කළ හැකි වේ. මෙය විශේෂයෙන් බලපාන්නේ දකුණු ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින රටවලට සහ අප්‍රිකානු රටවලට ය.

- **ආසියාව ඔස්සේ වර්ධනය වූ ඉහළ ඉල්ලුම** (Increased demand across Asia)

චීනය සහ ඉන්දියාවෙ හි ආහාර සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම සහ එම රටවල නිෂ්පාදන අපනයන සීමා කිරීම: මෙම රටවල පවතින සීඝ්‍ර ආර්ථික වර්ධනයත් සමඟ සිදුව ඇති ආහාර පාරිභෝජන රටාවේ වෙනස්කම් හේතුවෙන් ඇති වී ඇති ඉහළ ඉල්ලුම හමුවේ අපනයනය සීමා කිරීම, චීනයේ ආහාර ද්‍රව්‍ය අපනයන බද්ද 26% දක්වා ඉහළ නංවා ඇති අතර ඉන්දියාව ද අපනයන බදු වැඩි කොට තිබේ. එමෙන්ම, මෙම රටවල් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා පැවති බදු අඩු කොට ඇත.

- **පෙට්‍රෝලියම් ඉන්ධන මිල ඉහළ යාම** (Impact of oil price increase)

ඉහළ යන පෙට්‍රෝලියම් ඉන්ධන මිල නිසා නැව් ගාස්තු සහ වෙනත් ප්‍රවාහන ගාස්තු විශාල ලෙස ඉහළ යාම. එමෙන්ම පෙට්‍රෝලියම් අඩංගු නිෂ්පාදන ලෙස ගැනෙන රසායනික පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය වැනි යෙදවුම් මිල ඉහළ යාම. මේ තත්ත්වය හේතුවෙන් අපනයන මිල ගණන් ඉහළ යාම සිදු වේ.

- **ජෛව ඉන්ධන නිෂ්පාදනය ඉහළ යාම** (Increase of bio-fuel production)

සීඝ්‍රයෙන් ඉහළ යන පෙට්‍රෝලියම් ඉන්ධන මිල ගණන් හමුවේ, ජෛව ඉන්ධන (Bio-fuel) නිපදවීම හා භාවිතයෙහි සුවිශේෂ වර්ධනයක් ලොව ප්‍රමුඛ පෙළේ රටවල් රැසකින්ම දක්නට ලැබේ. ප්‍රධාන ජෛව ඉන්ධන වර්ග දෙක (2) වන්නේ එතනෝල් (Ethnol) හා ජෛව ඩීසල් (Bio-diesel) වේ. එතනෝල් යන්න බඩඉරිඟු, උක් ප්‍රධාන වෙනත් තෙල් භෝග වලින් නිෂ්පාදනය කරනු ලබන අතර ජෛව ඩීසල් එළවළු තෙල් හා සත්ත්ව මේදය මගින් බහුලව නිපදවනු ලබයි. මේ අයුරින් ලෝකයේ එතනෝල් නිෂ්පාදනය වසර 2000 සිට 2005 අතර කාලයේ දී දෙගුණයකින් වැඩි වී තිබේ. මෙම ද්‍රව්‍ය ප්‍රධාන නිෂ්පාදිත

රටවල් වන්නේ බ්‍රසීලය, එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව හා යුරෝපා සංගමයයි. බ්‍රසීලයේ ප්‍රවාහනය සඳහා භාවිතා කරන ඉන්ධන අවශ්‍යතාවයෙන් 30% එතනෝල් මගින් සපුරාලනු ලබයි. වර්තමානයේ ලෝක එතනෝල් නිෂ්පාදනය ලීටර් බිලියන 40ක් වන අතර මෙයින් 90%ම බ්‍රසීලය හා එක්සත් ජනපදය තුළ නිපදවයි. 2006/2007 වර්ෂ වල දී එක්සත් ජනපදයෙහි මුළු බඩඉරිඟු නිෂ්පාදනයෙන් 1/5 ක් එතනෝල් නිෂ්පාදනය සඳහා වැය කොට තිබේ. ජෛව ඉන්ධන නිෂ්පාදනය මගින් ග්‍රාමීය ප්‍රදේශ වල විශාල වශයෙන් රැකියා උත්පාදනය වීම ද මෙහි වර්ධනයට බලපා ඇති ප්‍රධාන කරුණකි. බ්‍රසීලය තුළ මිලියනයක් සෘජු රැකියා මෙමගින් ජනිත වී තිබේ. ජෛව ඉන්ධන භාවිතයෙහි ඇති සුවිශේෂී ලක්ෂණය වන්නේ එහි ඇති පරිසර හිතකාමී බවයි. පෙට්‍රෝලියම් ඉන්ධන දහනයෙන් සිදුවන දැවැන්ත පරිසර හානිය, ජෛව ඉන්ධන භාවිතයෙන් අවම කර ගැනීමට හැකිවීම ද බොහෝ රටවල් මේ සඳහා යොමුවීමට බලපාන ලද ප්‍රධානම කරුණකි. මෙම කරුණු වලට අමතරව, බොහොමයක් රටවල සුරක්ෂිත ආහාර තොග පහළ මට්ටමක පැවතීම ද (Declining world food stockpiles) ආහාර අර්බුදය ඇතිවීමට හේතු වූ කරුණු අතර වෙයි. එමෙන්ම, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳ පොළ අස්ථාවරත්වය, නිදහස් වෙළඳ ප්‍රතිපත්තිවල අහිතකර බලපෑම්, එක්සත් ජනපදය වැනි රටවල් ජෛව ඉන්ධන නිපදවීම සඳහා සහනාධාර ලබාදීම (Bio fuel subsidies) වැනි සාධක මගින් අර්බුදකාරී තත්ත්වය වඩාත් තීව්‍ර කිරීමට හේතු වී තිබේ.

○ **සංවර්ධනය සඳහා කෘෂිකර්මය** (Agriculture for development)

2008 වසර සඳහා ලෝක බැංකුව මගින් නිකුත් කරන ලද ලෝක සංවර්ධන වාර්තාවෙහි (World Development Report, 2008) තේමාව ලෙස තෝරා ගෙන ඇත්තේ සංවර්ධනය සඳහා කෘෂිකර්මය යන්නයි. වසර 25කට පසු, මෙම වාර්තාවේ තේමාව ලෙස කෘෂිකර්මය යොදා ගැනීම තුළින් කෘෂිකර්මයෙහි වැදගත්කම වඩාත් පැහැදිළි වෙයි. පවතින ලෝක ආහාර අර්බුදයත් සමඟ සෑම රටක්ම පාහේ ආහාර නිෂ්පාදනය හා ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව වැඩි අවධානය යොමු කොට ඇත. ලෝක සංවර්ධන වාර්තාව පෙන්වා දෙන පරිදි තිරසාර සංවර්ධනය සහ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා කෘෂිකර්මය තුළින් තවදුරටත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු විය යුතු වේ. වසර 2015 දී දිළිඳුකම අඩු කිරීමට යන සහස්‍රයේ සංවර්ධනය වන රටවල් කෘෂිකර්මය සඳහා ආයෝජන වැඩි කළ යුතුය. එමෙන්ම, විශේෂයෙන් සංවර්ධනය වන රටවල් සියළුම සංවර්ධන වැඩසටහන්වල දී කෘෂිකර්මය කේන්ද්‍ර කොට සැලසුම් කළ යුතු බව මෙම වාර්තාව වැඩිදුරටත් පෙන්වා දෙයි.

○ **දේශීය කෘෂිකර්මය** (Domestic agriculture)

සැබැවින්ම, ශ්‍රී ලාංකිකයන් කෘෂිකර්මය ආත්මය කොටගත් ජාතියකි. එමනිසා, අතීතයේ පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලිය ලැබුවේ දේශීය ස්වයංපෝෂිත ආර්ථිකයේ සවිමත් බව නිසාය. සශ්‍රීක ඉසුරුබර භූමියක ජන්ම ලාභය ලත් අපි ස්වයංපෝෂිත සෞභාග්‍යමත් රටක සැබෑ උරුමක්කරුවෝ වෙමු. ශ්‍රී ලංකාවේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික පදනම හා කෘෂිකර්මාන්තය අතර පවතින ධනාත්මක සම්බන්ධතාවය සනාථ කිරීමට ඉතිහාසයෙන් ලබා ගත හැකි උදාහරණ අපමණය. සුවිශේෂී ජෛව විවිධත්වයකින් (Bio diversity) පොහොසත්, මෙරට පවතින මල් පිපෙන ශාක විශේෂ 3,500ට අධික ප්‍රමාණයෙන් විශේෂ 850ක්ම මෙරටට ආවේණික (Endemic) වූ ඒවා ය. කෘෂිකාර්මික ආර්ථිකයකට අත්‍යාවශ්‍ය වන භූගෝලීය පිහිටීමත්, දේශගුණික රටාවත්, ජෛව විවිධත්වයත්, මෙම දේශයට උරුම වී තිබේ. මධ්‍යම කඳුකරයෙන් ගලා එන මහා

ජල ප්‍රවාහයන් අවුරා මහ ඇළ මං හා යෝධ වැව් තැනූ මුතුන්මිත්තෝ, දිවයිනේ උතුරු මැද තැනිතලාවත්, දකුණු දිග තැනිතලාවත් සරුසාර කෙත් යායෙන් සුසැදි ඉසුරුබර රටක් බවට පත් කළහ. ස්වයංපෝෂිත ආර්ථිකය සහ සෞභාග්‍ය අතීතයට පමණක් සීමා කොට එහි අභිමානය පමණක් පුන පුනා කියන යුගය නිමාවට පත් කරන්නට දැන් කාලය එළඹ තිබේ. ඒ සඳහා ලෝක ආහාර අර්බුදයේ බලපෑම මේ වන විටත් අනතුරු හඟවා ඇත.

නිදහසින් පසු ආර්ථික සමෘද්ධිය අත් කර ගැනීම සඳහා තිබූ ස්වර්ණමය අවස්ථා දෙකක් (Missed opportunities) මඟ හැරී තිබේ. ඉන් පළමුවැන්න 1960 දශකයේ අග භාගයේ දී දේශීය අපනයන සඳහා ලෝක වෙළඳ පොළෙන් ඉහළ මිල ගණන් ලැබුණු අවධියයි. විනිමය ආදායම ඉහළ මට්ටමක පැවතිය ද, එම තත්ත්වය නිසි ලෙස කළමනාකරණය කර ගත නොහැකිවීම නිසා එම අවස්ථාව මෙරටට අහිමි විය. අනෙක් අවස්ථාව නම් 1978 වර්ෂයේ දී (වාර්තාගත 8.2% වර්ධන වේගයක් ලබාගත් වර්ෂය) ඇති වූ ආර්ථිකයේ ප්‍රගමනය, නිසි කළමනාකරණයක් නොමැති ප්‍රතිපත්ති හේතුවෙන් තිවැරදි මාවතකට ගැනීමට නොහැකිවීම යි. මෙම අවස්ථා දෙකම මෙරටට අහිමි වූ අවස්ථාවන් විය.

වර්තමානයේ පවතින ලෝක ආහාර අර්බුදයත් සමඟ රට නැවත ආර්ථික සමෘද්ධිය ළඟා කර ගත හැකි තෙවන අවස්ථාවට පැමිණ සිටියි. මෙවර ඇති විශේෂත්වය නම් මෙම අවස්ථාව ලැබී ඇත්තේ අර්බුදයක් ද සමඟ වීමයි. පවතින සම්පත් නිසි ලෙස කළමනාකරණය කොට ගෙන ආහාර අර්බුදයට සාර්ථකව මුහුණදීමට හැකි වුවහොත් මෙවර එකී අභියෝගය ජය ගත හැකි වනු ඇත. මෙහි දී, ලෝක ආහාර අර්බුදයේ සංඥවන් ලැබීමටත් පෙරම දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම ආරම්භවීම සුවිශේෂී කරුණකි.

○ **අභියෝග සහ අවස්ථාවන්** (Challenges and opportunities)

මෑතක සිට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය කර්මාන්ත හා සේවා යන අංශ හා සැසඳීමේ දී අඩු වර්ධන මට්ටමක පවතී. 2007 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදනයට (Gross National Product) කෘෂිකාර්මික අංශයේ දායකත්වය වැවිලි කර්මාන්ත, ධීවර හා වන සම්පත් අංශ ද ඇතුළුව 12.8 කි. මෙරට ග්‍රාමීය ජනතාව ගෙන් 70%ක් පමණ කෘෂිකර්මය ආශ්‍රිත ජීවනෝපායයක නියැළී සිටින අතර ග්‍රාමීය අංශයේ ජනගහනයෙන් 25%ක් ද, වතු අංශයේ ජනගහනයෙන් 30%ක් ද, දරිද්‍රතාවයට ලක් ව සිටිති. බොහෝ ආහාර වර්ග වල ඒක පුද්ගල පාරිභෝජනය අවම පෝෂණ අවශ්‍යතාවයට වඩා පහළ මට්ටමක පවතී. ග්‍රාමීය ප්‍රදේශයන් හි වයස අවුරුදු 5ට අඩු දරුවන්ගෙන් 30%ක් පමණ මන්දපෝෂණයෙන් පෙළෙති. රටේ ආහාර අවශ්‍යතාවයෙන් 32%ක් පමණ එනම් වසරකට රුපියල් බිලියන 100ක් පමණ වැය කරමින් ආනයනය කෙරේ. 2006 වසරේ දී ශ්‍රී ලාංකිකයෙකු සිය ආදායමෙන් 36%ක් ආහාර සඳහා වැය කොට ඇත.

2006 මැයි සිට 2008 මැයි මාසය දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) 43%ක වැඩිවීමක් පෙන්නුම් කර තිබේ. ශ්‍රී ලංකාවේ ආහාර උද්ධමන ප්‍රතිශතය 2008 මැයි මාසය වන විට 34% කි.

ලෝක ආහාර අර්බුදය මෙරටට ද බෙහෙවින් බලපෑ අතර 2007 වසර මුළුල්ලේම රට තුළ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල සීඝ්‍ර ලෙස ඉහළ යෑමක් දක්නට ලැබුණි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය මගින් නිකුත් කරන මාසික ආහාර ද්‍රව්‍ය විවරණිකාවට අනුව, 2008 ජනවාරි මස පැවති සියළුම සහල් වර්ග වල තොග මිල ගණන් 2007 ජනවාරි මස පැවති මිලට සාපේක්ෂව 73% සිට 110% දක්වා වැඩිවීමක්

පෙන්නුම් කරයි. එම කාල පරිච්ඡේදය තුළ තිරිඟු පිටි සිල්ලර මිල වැඩිවීම 83%ක් වූ අතර අනෙකුත් ආහාර ද්‍රව්‍ය වල මිල ද සැලකිය යුතු ලෙස වැඩිවීමක් සිදු විය. එමෙන්ම, ගොවියාට වී සඳහා ලැබෙන නිෂ්පාදන මිල ද 2007 ජනවාරි මසට සාපේක්ෂව 80% සිට 134% ප්‍රමාණයකින් ඉහළ යාමක් පෙන්නුම් කරයි. 2007 වසර තුළ දී සහල් මිල ඉහළ යාම සඳහා වී නිෂ්පාදනය 6%කින් අඩුවීම, ප්‍රමාණවත් ආනයනික තොග වෙනත් රට වලින් ලබා ගත නොහැකිවීම හා සහල් සඳහා වසුන්පන්න ඉල්ලුමක් නිර්මාණයවීම වැනි කරුණු ද බෙහෙවින් බලපා ඇත. 2007 වසර තුළ දී, වී මිල අභිබවා බඩඉරිඟු මිල ඉහළ යෑම ද සුවිශේෂී කරුණකි.

මෙම අර්බුදකාරී තත්ත්වය අවම කර ගැනීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් උපාය මාර්ගික වැඩසටහන් අනුගමනය කිරීම අත්‍යාවශ්‍යය. මේ සඳහා දරිද්‍රතා මට්ටමෙන් පහළ සිටින ජනගහනය ඉලක්ක කොට විශේෂිත සහනාධාර වැඩසටහන් (Safety nets) ක්‍රියාත්මක විය යුතුය. එමෙන්ම, කෙටි කාලීන වශයෙන් ආනයන සහනාධාර, කෘෂිකාර්මික යෙදවුම් සඳහා සහනාධාර, කෘෂිකාර්මික අපනයනය සීමා කිරීම වැනි කරුණු ද, දිගු කාලීන වශයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු විය යුතුය.

○ **නව ප්‍රවණතා** (New trends)

වී නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ රටක් වශයෙන් සුවිශේෂී වර්ධනයක් අත් කරගෙන තිබුණ ද, අනෙකුත් භෝග වගා ක්ෂේත්‍රයන් හි පවතින තත්ත්වය පිළිබඳව සතුටට පත් විය නොහැක. වෙනත් භෝග වගා ක්ෂේත්‍රයන් හි ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වේගවත් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් අවශ්‍ය ය. එමෙන්ම, නව තාක්ෂණය ප්‍රචලිත කිරීම, වැඩි අස්වනු දෙන ප්‍රභේද, පසු අස්වනු හානි අවම කිරීම, කෘෂි ව්‍යාප්ති සේවය වැඩි දියුණු කිරීම, අලෙවිකරණ ව්‍යුහයන් ශක්තිමත් හා කාර්යක්ෂම කිරීම, පාරිභෝජන රටාවන් වැඩිදියුණු කිරීම, කෘෂි ආශ්‍රිත කර්මාන්ත ප්‍රචලිත කිරීම හා ඉහළ ගුණාත්මයෙන් යුත් කෘෂිකාර්මික බීජ වැඩි දියුණු කිරීම වැනි අභියෝග ජය ගත යුතුව තිබේ. එමෙන්ම, පරිසර හිතකාමී, තිරසාර කෘෂිකර්ම සංවර්ධන උපාය මාර්ග කෙරෙහි සියළු වැඩසටහන් වල අවධානය යොමු වීම අත්‍යාවශ්‍යය.

මෑතක සිට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ආයෝජනය සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය කැපී පෙනෙන ලෙසින් වර්ධනය වී ඇත. මේ අතුරෙන් කෘෂිකර්මය ආශ්‍රිත සංචාරක කර්මාන්තය (Agro tourism), උද්‍යාන භෝග වගාව (Horticulture), බඩ ඉරිඟු සහ සෝයා වගාව (Maize and Soya cultivation), කාබනික කෘෂිකර්මය (Organic agriculture), අපනයන භෝග වගාව (Export oriented crops), කෘෂි යන්ත්‍රෝපකරණ කර්මාන්තය (Agro machinery) සහ බීජ, පොහොර නිෂ්පාදනය (Seed & fertilizer industry) වැනි ක්ෂේත්‍ර ප්‍රධාන වේ. පුද්ගලික අංශයේ මෙම සහභාගීත්වය ඉතාමත් වැදගත් ය. මේ තුළින් වඩාත් ඉහළ ප්‍රතිඵල, මේ වන විට ද දක්නට ලැබේ. උදහරණයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ (Forward trade agreements) බඩඉරිඟු හා සෝයා බෝංචි වගාව සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වෙමින් පවතී. කන්න කිහිපයක් තුළ දී දිස්ත්‍රික්කය තුළ බඩඉරිඟු වගාව දෙගුණයකටත් වඩා වැඩිවීමක් පෙන්නුම් කරයි. ගොවි පවුල් විශාල සංඛ්‍යාවක් සමාගම් සමඟ සම්බන්ධ වී සිදුවන මෙම කෘෂිකාර්මික ව්‍යාපෘතිය බෙහෙවින් සාර්ථක මට්ටමක පවතී. ශ්‍රී ලංකා මහ බැංකුව, උතුරු මැද පළාත් සභාව වැනි රාජ්‍ය ආයතන මෙම වැඩසටහන් සඳහා පහසුකම් සලසයි. මේ ආකාරයට රාජ්‍ය ආයතන, පහසුකම් සලසන්නන්ගේ කාර්යභාරය ඉටු කරමින් පුද්ගලික අංශය කෘෂි ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා පෙළඹවීම (Public-private Sector

Partnership), ඉතාමත් සුබවාදී ප්‍රවේශයකි. 2007/2008 මහ කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය 2006/2007 මහ කන්නයට වඩා 8% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එමෙන්ම, අනෙකුත් ක්ෂේත්‍ර භෝග සහ එළවළු වගා බිම් ප්‍රමාණයේ ද වැඩිවීමක් සිදු වී ඇත. තව ද, ආනයනය සඳහා කැපුම් මල් වගාව, ආරක්ෂිත ගෘහ තුළ වගාව, කාබනික කෘෂිකර්මය, පලතුරු වගාව, සහල් සහ ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත වීම, ගෙවතු වගාව සහ කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය වැනි ක්ෂේත්‍රවල සතුටුදායක ප්‍රගතියක් ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ සිදු වෙමින් පවතී.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව, ඉදිරි වසර තුළ දී ද, ආහාර ද්‍රව්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පවතිනු ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යම් සුබවාදී ප්‍රවණතාවයක් වර්ධනය වීමක් මෑතක සිට රට තුළ සිදු වෙමින් තිබේ. දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුමේ ප්‍රධාන අරමුණු දහය ඉලක්ක කර ගනිමින්, සියළු සංවර්ධන වැඩසටහන් තිරසාර කෘෂිකර්මය පදනම් කර ගත් ප්‍රවේශයකින් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. දේශීය කෘෂි විද්‍යාඥයින්, ආහාර විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින්, ආර්ථික විද්‍යාඥයින් සහ පාරම්පරික දනුම සහිත ගොවි මහතුන් සියල්ල එක් වී, ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තිරසාර, පරිසර හිතකාමී කෘෂිකාර්මික වැඩසටහන් වලට අවතීරණවීමට කාලය පැමිණ තිබේ. එවන් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් ඕනෑම අභියෝගයක් සාර්ථක ලෙස ජය ගැනීමට හැකි වනු නොඅනුමානය. ඒ තුළින් ලෝක ආහාර අර්බුදයට සාර්ථක ලෙස මුහුණ දීමට හැකිවනවා පමණක් නොව ඒ තුළින් ආර්ථික සමෘද්ධිය ළඟා කර ගත හැකි ස්වර්ණමය අවස්ථාවකට අවතීර්ණවීමට දේශීය වශයෙන් හැකියාව ලැබෙනු නිසැකය.

**ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා**
සංඛ්‍යාන නිලධාරී
අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර
අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## ගොවි ජනතා

"**ගොවි ජනතා**" සඟරාව පිළිබඳව ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේම. ඒවා ඉදිරි කලාපයන් හි පල කිරීමට ද කටයුතු කෙරේ. එබැවින්. එවැනි ද සංස්කාරක වෙත දන්වා එවන මෙන් පාඨක ඔබට ආරාධනා කරමු.

**සංස්කාරක**
**"ගොවි ජනතා"**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.**
114. විජේරාම මාවත.
**කොළඹ** - 07.